# වේලිඔය වනසන යෝජිත හිඩ්න් වැලී ගොල්ෆ් පිටියට ඔබ විරුද්ධ විය යුත්තේ ඇයි?




ගොල්ෆ් පිටිය තනන ස්ථානයේ ගූගල් සිතියම

හිඩීන් වැලි ගොල්ෆ් පිටිය යනු ඇල්ෆා සහ ඔමේගා සමාගම කලකට ඉහත බෙරගල ගොල්ෆ් සහ හොලිඩේ රිසෝට් ලෙස සොරගුනේ කුඩා කතරගම දේවාලයට අයත් අක්කර 623 ක නින්දගම් ඉඩම් ඒවා වගා කල ජනතාව මුලා කොට විවිධ අයථා ක්‍රම මගින් සුළු මුදලකට ලබාගෙන සකස් කිරීමට උත්සාහ කල ගොල්ෆ් පිටියම වේ.

මෙමගින්, රුපියල් මිලියන 7150 වියදම් කොට මඩ ඉඩම් හෙක්ටෙයාර 17000 හා ගොඩ ඉඩම් හෙක්ටෙයාර 21000 කට ජලය සැපයීමට සකස් කල, දැනට ගොවි පවුල් 7000 ජීවත් කරවන වේලිඔය ව්‍යාපෘතියට ජලය සපයන වේලි ඔයේ, කාන්කන් ඔයේ හා දෙමට ආරේ ජලධරය සම්පුර්ණයෙන්ම වනසා දමනු ඇත.

මෙම භූමිය දැනට අලි ඇතුන්, වලසුන්, දිවියන් හා වෙනත් දුර්ලභ සතුන් වෙසෙන යෝජිත බෝගහපට්ටිය අභය භූමියට හෝ එහි මායිමට අයත් වන අවුරුදු දහස් ගණනක් වයසැති ගස්කොලන් සහිත වනාන්තරයකි. එය වනසා දැමීමට ඉඩදීම ජාතික අපරාධයකි.



ගොල්ෆ් පිටියක් සඳහා දිනකට ජලය ඝන මීටර 3000 සිට 5000 අවශ්‍ය වන අතර එය කුඹුරු අක්කරයක් සඳහා එක් කන්නයකට අවශ්‍ය වන ජල ප්‍රමාණයට සමාන වේ.

සිදුරු 18 ක ගොල්ෆ් පිටියක් සඳහා කිලෝ ග්‍රෑම් 22680 ක් පමණ පොහොර හා කෘමිනාශක යොදන අතර එලෙස යොදන කෘමිනාශක ප්‍රමාණය පමණක් කිලෝග්‍රෑම් 1500 පමණ වන අතර ඉන් බොහොමයක් ඒවා පිලිකා වලට හේතුකාරක වන අතර විශේෂයෙන්ම මෙම පරිසරය ආශ්‍රිතව වේලි ඔයේ, කාන්කන් ඔයේ හා දෙමට ආරේ ජීවත් වන බුලත් හපයා ඇතුලු ආවේනික මසුන් වඳ වීමට හේතුවක් වනු ඇත.

අධික විෂ සහිත ක්ලෝරොතලොනිල්, 2 4 ඩී, බෙන්සුලිඩ්, ඩැක්තල් (ඩීසීපීඒ) ආදි රසායනික ද්‍රව්‍ය රාශියක් ගොල්ෆ් පිටි වල යොදන අතර මේවා නිසා පිලිකා සමේ රෝග ඇතුලු රෝග රාශියක් ඇතිවේ.

වේලි ඔයේ බැම්ම

මෙම නින්දගම් ඉඩම් වලට පුරා විද්‍යාත්මක වටිනාකමක් ඇති බව පැවසෙන අතර, ආදි මානවයන් යපස් උණු කල උදුන්ද මෙහි ඇති බවට තොරතුරු ලැබී ඇත.

නින්දගම් ඉඩම් පුරාණ රජවරුන් දේවාලවලට ලබාදී ඇත්තේ ඒවා භුක්ති විඳින නිල පංගුකරුවන් දේවාලයේ පැවැත්ම සඳහා නිල රාජකාරියේ යෙදවීමේ අවශ්‍යතාව සලකා වන අතර එම ඉඩම් ගොල්ෆ් පිටියකට හැරවීම මගින් හා ඒවායේ අයිතිය කොළඹ ඇති විදේශීය හවුල්කරුවන් පාලනය කරන සමාගමකට පැවරීම අතිශය දේශ-ද්‍රෝහී ක්‍රියාවක් වන වග නොකිවමනාය.

මෙම ගොල්ෆ් පිටියෙන් වේලි ඔයට සිදුවිය හැකි අනර්ථය සලකා වාරිමාර්ග දෙපාර්තමේන්තුව 16/8/2011 දින දරන ලිපියකින් එයට විරෝධතාවය මධ්‍යම පරිසර අධිකාරිය වෙත දන්වා ඇත.

වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවද තම විරෝධතාවය මධ්‍යම පරිසර අධිකාරිය වෙත දන්වා ඇත.

ප්‍රදේශයේ පවතින පාරිසරික තත්වය ගැන අබමල් රේණුවකද තැකීමක් නොමැතිව හා සියවස් කිහිපයක් ප්‍රදේශයේ ජනතාවගේ වන්දනාමානවලට පාත්‍ර වුනු සොරගුනේ කුඩා කතරගම දේවාලය අවතක්සේරුකර මෙම ගොල්ෆ් පිටිය සෑදීමට මුදලට යටව කටයුතු කරන ඇතැම් දේශපාලන බලවතුන් හා අනෙකුත් තැරැව්කරුවන් අප තරයේ හෙලා දකිමු.

මේ සඳහා පරිසර වාර්තාවක් සැකසීමකින් තොරවම මෙය නතර කල යුතුව තිබුනු නමුත්, පරිසර අධිකාරිය එයට පරිසර වාර්තාවක් සැකසීමට අනුබල දීම ගැන අප විරෝධය දක්වමු.

වේලිඔයේ ජල මූලාශ්‍රය මෙලෙස වනසා දැමීමට ජනියා පරිසර වාර්තා සකස් කරමින් ජනතාවට බොරු කියමින් ප්‍රදේශවාසී ජනතාව රවටන පරිසර තක්සේරු වාර්තා සකසන ආයතන අප හෙලා දකිමු.

නින්දගම් ඉඩම් අයථා ක්‍රම වලින් ලබාගෙන සොරගුනේ දේවාලයේ භාරකරුවන් හා ප්‍රදේශයේ බුද්ධ පුත්‍රයන් රවටා පරිසරයට නොගැලපෙන ගොල්ෆ් පිටියක් සකස් කිරීමට උත්සාහ දරන ඇල්ෆා සහ ඔමේගා සමාගම හා ඔවුන්ගේ තැරැව්කරුවන් වහාම එය නතර කොට අයථා ක්‍රම වලින් ලබාගත් සියලු ඉඩම් නැවත දේවාලයට පවරා එහි මතුපැවැත්ම තහවුරු කරන ලෙස අප බලකර සිටිමු.



## නිහඬව සිටියා ඇති!

**ඔබේ ගොවිබිමට ජලය සපයන වේලි ඔය ව්‍යාපාරය රැකගැනීමට පෙරට එන්න.**



**වේලිඔය සුරැකීමේ සංවිධානය**
**වේලිඔය**

